# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.09.28 පැය 1930 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out//2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

## 01. මාරක රිය අනතුරක් - ජාඇල පොලිස් වසම.

2025.09.28 වන අද දින අළුයම් කාලයේ ජාඇල පොලිස් වසමේ ජාඇල මිනුවන්ගොඩ මාර්ගයේ මොන්ටා හන්දිය අසලදී ජාඇල දෙස සිට මිනුවන්ගොඩ දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ කණුවන, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2025.09.28 වන අද දින අළුයම් කාලයේ තලංගම පොලිස් වසමේ කොල්ලුපිටිය කඩුවෙල මාර්ගයේ තලාහේන ප්‍රදේශයේදී මාළඹේ දෙස සිට කොස්වත්ත දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගැනීමට නොහැකිව පසුපැදිකරු සමඟ මාර්ගයේ පෙරළී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කාර් රථයක ඉදිරිපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පසු පැදිකරු බරපතල තුවාල ලබා කොස්වත්ත රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත. පසු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොස්වත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. හදිසි ගින්නක් - හල්දුම්මුල්ල පොලිස් වසම.

2025.09.28 වන අද දින දහවල් කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි මහවංගුව ප්‍රදේශයේ ගින්නක් හටගෙන ඇති

බවට හල්දුම්මුල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත හල්දුම්මුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්, හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්, හල්දුම්මුල්ල වනජීවී නිලධාරීන්, වන අඩවි නිලධාරීන් හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් එක්ව ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කරමින් සිටි.

මෙම ගින්නෙන් තුවාල හෝ ජීවිත හානි කිසිවක් සිදුව නොමැත. ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර හල්දුම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**